නව කැළණි පාලම සිට අතුරුගිරිය දක්වා කණු මතින් ඉදිවන අධිවේගී මාර්ග - 2020

---

නව කැළණි පාලම සිට අතුරුගිරිය දක්වා කණු මතින් ඉදිවන අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන,ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ රටේ මූල්‍ය හා පරිපාලන නගරවල අධික රථවාහන තදබදය අඩුකිරීම සහ සපයන සේවාව වැඩිදියුණු කිරීමේ අරමුණින් වරාය නගරය, කොළඹ වරාය, මාලබේ අධ්‍යාපන කේන්ද්‍රය සහ බත්තරමුල්ල පරිපාලන කේන්ද්‍රය ඇතුළුව කොළඹ සිට පවතින අධිවේගී මාර්ග ජාලය සම්බන්ධ කිරීම මගින් අධිවේගී මාර්ග ජාලයේ සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම වේ. ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු. බිලියන 193ක් වූ අතර ප්‍රධාන මංතීරුවේ දිග ආසන්න වශයෙන් කිලෝමීටර 16.4කි. යෝජිත ව්‍යාපෘතිය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව පදනම මත නිර්මාණය-ගොඩනැගීම-මූල්‍යයනය-නඩත්තුව මත ක්‍රියාත්මක කිරීමට නියමිත අතර 2025 වන විට වර්ෂ 3ක් ඇතුලත නිම කිරීමට නියමිතය.

**1.3 මතය**

---

ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂ සඳහා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශණ සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරිම, සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳව වගකීම ඊට සම්බන්ධ පාර්ශවය විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශණ විගණනය කිරීම සම්බන්ධව විගණකගේ වගකීම**

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී ඒ සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑම් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය හා වෘත්තීය සැකයෙන් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනානොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සහ සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගන්නා අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු අඩුපාඩුද ඇතුළුව සැලකිය යුතු විගණන සොයාගැනීම් හා අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ඊට සම්බන්ධ පාර්ශවයන් සමඟ මම සන්නිවේදනය කරමි.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව භෞතික හා මූල්‍ය ප්‍රගතිය

ව්‍යාපෘතිය එහි කටයුතු **2016** දී ආරම්භ කර තිබුණද, **I** අදියරේ ශක්‍යතා අධ්‍යයනය (නව කැළණි පාලමේ සිට රාජගිරිය දක්වා කිලෝමීටර් **6.9) 2015** වර්ෂයේදී දක්ෂිණ අධිවේගී මාර්ගය කොළඹ දෙසට දිගුව ව්‍යාපෘතියේ විෂය පථය යටතේ නිම කර තිබුණු අතර **II** අදියරේ ශක්‍යතා අධ්‍යයනය (රාජගිරියේ සිට අතුරුගිරිය දක්වා කිලෝමීටර් **10.4)** ආරම්භක එකඟ වූ කාලපරිච්ඡේදයේ සිට දින **294** ප්‍රමාදයකින් පසුව **2019** අගෝස්තු **22** සම්පූර්ණ කර ව්‍යාපෘතියට භාරදී තිබුණි. තවද, මහා මාර්ගයේ මංතීරු පාරිසරික ආරක්ෂිත ප්‍රදේශ හරහා ඉදිවෙන බැවින් **2021** සැප්තැම්බර් **30** දින වන

විටත් මධ්‍යම පරිසර අධිකාරිය විසින් II අදියර සඳහා පාරිසරික බලපෑම් ඇගයීමේ වාර්තාව අනුමත කර නොතිබුණි.

## 2.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- |
| තරඟකාරී ලංසු ක්‍රමවේදය යටතේ ව්‍යාපෘතිය සඳහා ආයෝජකයෙකු තෝරා ගැනීමට 2016 දී කටයුතු ආරම්භ කර තිබුණද, එය 2020 මැයි 06 දින අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි වර්ෂ 04කට පසු අවලංගු කර තිබුණු අතර සීමාසහිත චයිනා හාබර් ඉංජිනේරු සමාගමේ ආයෝජන යෝජනාව ඇගයීම සඳහා ආයෝජන මණ්ඩලය සමඟ කටයුතු කිරීමට මහාමාර්ග අමාත්‍යාංශයට පවරා තිබුණි. කෙසේවෙතත්, 2021 සැප්තැම්බර් 30 වන විටත් ව්‍යාපෘතිය සඳහා ආයෝජකයකු තෝරා ගෙන නොතිබුණි. | කැබිනට් මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කිරීමට කැබිනට් මණ්ඩලයට පත්කළ ඇගයීම කමිටුව සහ ව්‍යාපෘති කමිටුව යෝජනාව ඇගයීම සහ සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | ඉලක්කගත දිනට කටයුතු නිම කිරීමට ප්‍රමාදයකින් තොරව ආයෝජකයකු තෝරා ගැනීමට පියවර ගත යුතුය. |

## 2.3 ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ ගැටලු

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- |
| ලැබී තිබුණු තොරතුරු අනුව, ව්‍යාපෘතිය විසින් අත්පත් කර ගැනීමට සැලසුම් කළ මුළු ඉඩම් කොටස් ප්‍රමාණය 2,035 ක් විය. ඉන් නව කැළණි පාලමේ සිට රාජගිරිය දක්වා කොටසේ රජයේ ඉඩම් කොටස් 1,136ක් ඇතුලුව ඉඩම් කොටස් 1,214ක් අත්පත් කර ගැනීමට නියමිත වූ අතර රාජගිරියේ සිට අතුරුගිරිය දක්වා කොටසේ රජයේ ඉඩම් ඇතුලුව ඉඩම් කොටස් 821 අත්පත් කර ගැනීමට නියමිත විය. නව කැළණිය පාලමේ සිට රාජගිරිය දක්වා කොටසේ ඉඩම් කොටස් 1,214ක් සඳහා 38 වගන්තිය ගැසට් කර තිබුණද 2020 දෙසැම්බර් 31 දක්වා වගන්ති 17 යටතේ කිසිදු ඉඩම් කොටසක් සඳහා වන්දි මුදල් ගෙවා නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට නව කැළණි පාලමේ සිට රාජගිරිය දක්වා කොටසේ සහ රාජගිරිය සිට අතුරුගිරිය දක්වා කොටසේ ඉඩම් අත්කර ගැනීමේ කටයුතුවල සත්‍ය භෞතික ප්‍රගතිය පිළිවෙළින් සියයට 55 සහ සියයට 03 වූ බව නිරීක්ෂණය විය. | ව්‍යාපෘතිය විසින් අත්කර ගත යුතු මුළු ඉඩම් කොටස් ප්‍රමාණය 2,035 ක් වේ. ඉන් නව කැළණි පාලමේ සිට රාජගිරිය දක්වා කොටසේ රජයේ ඉඩම් කොටස් 1,136 ක් ඇතුලුව ඉඩම් කොටස් 1,214ක් අත්කර ගැනීමට නියමිත වූ අතර රාජගිරිය සිටය අතුරුගිරිය දක්වා කොටසේ රජයේ ඉඩම් ඇතුලුව ඉඩම් කොටස් 821 අත්පත් කර ගැනීමට නියමිත විය. 2020 වර්ෂය අවසාන වන විට නව කැළණි පාලමේ සිට රාජගිරිය දක්වා කොටසේ සහ රාජගිරිය සිට අතුරුගිරිය දක්වා කොටසේ ඉඩම් අත්කර ගැනීමේ කටයුතුවල සත්‍ය භෞතික ප්‍රගතිය පිළිවෙළින් සියයට 55 සහ සියයට 03 විය. | ඉලක්කගත දිනයන්ට ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු නිම කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාල, මිනින්දෝරු දෙපාර්තමේන්තුව සහ තක්සේරු දෙපාර්තමේන්තුව සමඟ නිසි සම්බන්ධතාවක් පවත්වා ගැනීමට පියවර ගත යුතුය. |

## 2.4 මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ගැටලු

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණන නිර්දේශ |
| --- | --- | --- |
| ව්‍යාපෘතියේ අනුමත කාර්ය මණ්ඩලය සේවකයින් 12 වේ. කෙසේවෙතත්, 2020 දෙසැම්බර් 31 දිනට එක් තාක්ෂණික නිලධාරියකු පමණක් ව්‍යාපෘතිය විසින් සේවයේ යොදවා තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු ඇතුලුව තනතුරු 20 ක් සඳහා කාර්ය මණ්ඩලය 35 දෙනෙකු අනුමත කර තිබුණි. අනුමත කාර්ය මණ්ඩල 35න්, නිලධාරීන් 28 දෙනෙකු 2021 ඔක්තෝබර් 31 දක්වා බඳවා ගෙන තිබුණි. | ඉලක්කගත දිනයන්ට ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමට සහ ව්‍යාපෘතියේ කටයුතු කාලීනව සිදු කිරීමට ප්‍රමාදයකින් තොරව අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට ව්‍යාපෘතිය විසින් පියවර ගැනීම අවශ්‍ය වේ. |